# තොරතුරු දැනගැනීමේ පනත සහ තොරතුරු සඟවන "රාවය"

දිගු කාලයක් පුරා විවිධ ආණ්ඩු යටතේ කතාබහට ලක් වූවද සම්මත කර නොගැණුනු තොරතුරු දැනගැනීමේ පනත ඉකුත් සතියක සම්මත විය. එම සතියේ (2016.06.26) දින රාවය පුවත්පතේ කතුවැකිය " තොරතුරු අයිතියේ ස්වර්ණමය යුගය " යනමින් පළ වූ අතර එම කතුවැකිය සහ තොරතුරු දැනගැනීමේ අයිතිය හා බැඳි සමකාලීන කතාබහ, රාවය වෙතින් සත්‍යය සහ නිරවද්‍යභාවය ඉල්ලමින් මවිසින් කළකට පෙර කළ කරුණු දැක්වීමක් ස්වකීය අභිමතයේ හිඳිමින් නොසළකා හැරියා වූ සිදුවීමක් පිළිබඳ වූ තොරතුරු මෙලෙසින් පොදු අවකාශය වෙත ගෙන ඒමට හේතු සාධක විය.

'Agenda 14′ සහ යුරෝපා සිනමා ඇකඩමිය එක්ව 2012 වසරේ දී පවත්වන්නට යෙදුන Agenda 14 කෙටි චිත්‍රපට උළලේ දී හොඳම සිනමා විචාරකයා වෙනුවෙන් "තිස්ස අබේසේකර විචාරක සම්මානය" යන නමින් රාවය අනුග්‍රහයෙන් සම්මාන පිරිනැමීමක් සඳහා සිනමා විචාර රචනා තරඟයක් පවත්වන්නට යෙදුන අතර එම සම්මානය සඳහා ඉල්ලුම් කිරීමට කැමති තරඟකරුවන්ගේ දැනගැනීම පිණිස ඒ සම්බන්ධයෙන් වූ සටහනක් 2012 අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝම්බර් යන මාස පුරාවට රාවය පුවත්පතෙහි පළ විය.

ඉහත විචාරක සම්මානය විකුම් ජිතේන්ද්‍ර දිනා ගත් බවට සහ ඔහු විසින් සම්මානය හිමි කර ගැනීමට හේතු පාදක වූවා යැයි "අංකිතකරණය අභිමුව දැක්මෙහි සාරය : ගොඩනැගීම සහ මුදා හැරීම" නම් වූ ලිපියක් 2012 දෙසැම්බර් 16 වන දින රාවය පුවත්පතේ පළ වූ අතර ඊට මාස කිහිපයකට පසු 2013 ජූලි 28 දින විකුම් ජිතේන්ද්‍ර විසින් "සොල්දාදුවෝ සහ ඉගිලෙන මාළුවෝ" යන මැයෙන් රාවයේ පළ කරන්නට යෙදුන ඔහුගේ තවත් ලිපියක විකුම් ජිතේන්ද්‍ර තම වසය පිලිබඳ කර තිබූ සඳහනකින් තිස්ස අබේසේකර විචරක සම්මානයට හිමිකම් කීමට ඔහුට ඇති හිමිකම පිළිබඳ කුකුසක් මා තුළ ඇති විය.

ඒ අනුව යමින් 2012 වසරේ අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝම්බර් යනමාසයන් හි රාවය පුවත්පත් නිරීක්ෂණය කළ විට දැක ගත හැකි වූයේ තිස්සඅබේසේකර විචාරක සම්මානය සඳහා දක්වා තිබූ සටහනෙහි ඊට ඉල්ලුම්කිරීමට කැමති අයවලුන් වයස අවු: 35 ට අඩු අය විය යුතු බව තරඟකොන්දේසියක් ලෙස පැහැදිලිව දක්වා ඇති බවයි. පෙර සඳහන්කළ " සොල්දාදුවෝ සහ ඉගිලෙන මාළුවෝ " ලිපිය අනුව තිස්ස අබේසේකර විචාරක සම්මානයට ඉල්ලුම් කරන විට වික්‍රම් ජිතේන්ද්‍ර 1974 වසරේ ඉපදුන වයස 38 ක අයෙකු විය යුතු බව අනුමාන කළ මා වික්‍රම් ජිතේන්ද්‍රගේ දුරකථන අංකය සොයාගෙන ඔහුට කතා කළ විට මාගේ අනුමානය නිවැරදි කරමින් තමන් 1974 උපන් අයෙකු බව ඔහු මා හා පැවසීය.

තිස්ස අබේසේකර විචාරක සම්මානය පිරිනැමීමේ කටයුතු සංවිධානය කෙරුනේ රාවයේ අනුග්‍රහයෙන් Agenda 14 වෙතින් වන නිසා විචාරක සම්මානයෙන් ජයග්‍රාහකයාගේ, ජයග්‍රහණයේ වලංගුභාවය පිළිබඳ විමසා රාවය වෙත කරුණු දක්වා ලිපියක් යැවීමට ප්‍රථම Agenda 14 හි අනෝමා රාජකරුණා වෙතින් උක්ත කරුණ පිළිබඳව ලිපියක් මඟින් විමසීමක් කළෙමි. දුරකථනයෙන් මා අමතා දීර්ඝ විස්තරයක් කළ ද මා මතු කළ මූලික කරුණට පැහැදිලි පිළිතුරක් දීමට ඇය අපොහොසත් වීම නිසා පුවත්පතෙහි පළකරනු පිනිස මාගේ අදහස් රැගත් ලිපිය රාවය වෙත යොමු කළෙමි.

( අනෝමා රාජකාරුණා සමඟින් කළ කතා බහේ දී ඇය පැවසූ කාරණාවක් වූයේ විචාරක සම්මානයට ඉදිරිපත් වීම සඳහා වූ තම ඉල්ලුම් පත්‍රය සහ රචනාව කොළඹ 07, හෝර්ටන් පෙදෙසෙහි Agenda 14 කාර්යාලයට වික්‍රම් ජිතේන්ද්‍ර විසින් ගෙනැවිත් භාර දුන් බවයි. ඇය පැවසූ කරුණ සත්‍යක් නම්, විචාරක සම්මානයට ඉල්ලුම් කරන්නන් තම ඉල්ලුම් පත්‍රය සමග රචනාව " ලියාපදිංචි තැපෑලෙන් 2012 ඔක්තෝම්බර් මස 25 " වන දිනට පෙර එවිය යුතු බවට රාවයේ පළ වූ අදාළ සටහනෙහි පැහැදිලිව දක්වා තිබිය දී ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු වූවක් වික්‍රම් ජිතේන්ද්‍ර තම අතින් ගෙන ගොස් භාර දුන්නේ කෙලෙසද? යනුවෙන් වූ අතිරේක ගැටළුවක්ද මා තුළ පැණ නැගිණ)

මාගේ ලිපිය රාවය පුවත්පත වෙත යොමුකර සති දෙකක් පමණ ඉක්ම ගියද ප්‍රතිචාරයක් නොවුනු තැන එවකට රාවයෙහි සේවය කළ විමලනාත් වීරරත්න මහතා අමතා කළ විමසීමක දී ලිපිය රාවය වෙත ලද පැවසූ මුත් ඉන් එපිටට වෙනත් ප්‍රතිචාරයක් නොවීය.

ලිපිය රාවයේ පළවීම හෝ වෙනත් සාධනිය ප්‍රතිචාරයක් නොලද තැන විනිශ්චය මණ්ඩලයේ සාමාජිකයින් වූයේ කවුදැයි මා සොයා දැනගත් පසු, විචාරක සම්මානයේ විනිශ්චය මණ්ඩලයේ කටයුතු ගාමිණී වියන්ගොඩ සහ චූලානන්ද සමරනායක මහත්වරුන් (තවත් වි:මණ්ඩල සාමාජිකයින් දෙනෙක් එහි අඩංගු විය) වෙත රාවයට යොමුකළ ලිපියේ පිටපත් සමගින් ඒ ආශ්‍රිතව පැන නැගී තිබූ වටපිටාව පිලිබඳ මාගේ අදහස් අඩංගු ලිපියක් යොමු කළෙමි. මා ඇමතූ ගාමිණී වියන්ගොඩ මහතා පවසා සිටියේ ස්වකීය විනිශ්චය සඳහා අදාළ රචනා නම් ගම් රහිතව අංකගත පිළිවෙලට තමන් වෙත ලැබුන බවත් ඒ අනුව තමන් විනිශ්චය ලබා දුන් බවත් ඉන් එපිටට තමාගේ කිසිඳු මැදිහත්වීමක් නොවූ බවයි. කෙසේ නමුත් ජයග්‍රාහකයාගේ වලංගුභාවය පිළිබඳ මාගේ අදහස් දැක්වීම් සමග එකඟවන බවත් යම් කිසි වරදක් සිදුව ඇති බවට තමන් හටද පෙනී යන බවත්ය.

මෙකී තත්ත්වය පිළිබඳ රාවයේ අයෙකුගේ අදහස් විමසිය යුතුයැයි සිතූ මම වික්ටර් අයිවන් මහතා අමතා ලිපියක් යැවීම. මාගේ ලිපිය ලද බව පවසමින් කතා කළ අයිවන් මහතා, රාවය වෙත යොමු කළ මාගේ ලිපිය පළමුව රාවයේ පළකර ඉන්පසු ඒ හා බැඳි අනෙක් පාර්ශවයන්ට් රාවය මඟින්ම අදහස් දැක්වීමට ඉඩ දිය යුතු බව තම ස්ථාවරය වන බවත් තම අදහස රාවය කර්තෘ කේ.ඩබ්.ජනරංජන වෙත දැක්වූ විට සුබවාදී ප්‍රතිචාරයක් ඔහුගෙන් පළ නොවූ බවටද පැවසීය. වැඩි දුරටත් අදහස් දැක්වූ අයිවන් මහතා තමා දැන් ප්‍රධාන කර්තෘ ධූරයේ හෝ කර්තෘ මණ්ඩල සාමාජිකයෙක් නොවන නිසා තම අභිමතය පෙර පරිදි ක්‍රියාවට නැංවිය නොහැකි බව පැවසීය.

මෙම සිදුවීම් වලින් ටික දිනකට පසු පැවති සම්මන්ත්‍රණයක් අතරතුර කේ.ඩබ්. ජනරංජන සමඟ කථා කිරීමට ඉඩක් හිමි වූ තැන මේ සම්බන්ධයෙන් ඔහුගේ අදහස් විමසා සිටියෙමි. එසැණ ඔහු මවෙතින් විමසූ කරුණ වූයේ රාවය කර්තෘ වන තමා වෙත මෙම කාරණය යොමු නොකර සහ ඔහු නොඅමතා අන් අය වෙත දුරකථනයෙන් කතා කරමින් අදහස් හුවමාරු කර ගන්නේ ඇයිද? යන්නයි. රාවය පුවත්පත නමට ලිපියක් යොමුකළ පසු සහ එය ලද බව තහවුරුකරගත් පසු නැවත එම පුවත්පතේම කර්තෘ වෙත එම ලිපිය යොමුකළ යුතුයැයි මා නොසිතන බවත් මා සමඟින් කතා කළ සියලු දෙනා දුරකතනයෙන් මා අමතා මට කතා කළ විනා මා ඔවුන් වෙත ඇමතුම් ලබා නොදුන් බවත් මාගේ පිළිතුර විය. මාගේ පිළතුරට කිසිවක් නොකී කේ.ඩබ්.ජනරංජන එම සම්මානය වැඩි දෙනෙක් අයදුම් නොකළ මෙන්ම හුදෙකලා වූ ද කල් ඉක්ම ගිය වූද සිදුවීමක් ද බව පවසමින් සංවාදය නිමා කළේය.

රාවය තම ආරම්භයේ පටන්ම සම්ප්‍රදායක් වශයෙන් අන් පුවත්පත් පළ කිරීමට පසුබට වන, මඟහැර යන මාතෘකා සංවාදයට ගනිමින් පාඨකයා මුල්කරගත් මාධ්‍යකරණයක නිරතව සිටි පුවත්පතකි. තොරතුරු සැඟවීම හෝ පාඨක අදහස් යටපත් කිරීම මා දන්නා රාවයේ සම්ප්‍රදාය නොවේ. නමුත් තිස්ස අබේසේකර විචාරක සම්මානයේ දී රාවය පාර්ශවය නියෝජනය කළ කේ.ඩබ්.ජනරංජන ප්‍රධාන කර්තෘ ලෙස තම අභිමතය මෙහෙයවා මා මතු කළ කාරණය යටපත් කළ බව මෙම සිදුවීම් සියල්ල අවසානයේ මාගේ නිගමනය විය.

මා රාවය පුවත්පත කියවීම ආරම්භ කළේ 10 ශ්‍රේණියේ පාසලේ සිසුවෙකුව සිටි ඈත අතීතයේ සිටිය. සංස්කෘතික වීරයන් හෝ පරමාදර්ශ අහිමිව සිටි අප පරම්පරාව රට, ලෝකය පිළිබඳ දැන උගෙන ගත්තේ අතේ ඇඟිලි ගණනටත් වඩා අඩු මූලාශ්‍ර මගිනි. රාවය ද ඉන් එකකි. නමුදු ඉහත සිදුවීම මගින් අන් බොහෝ දෑ සම්බන්ධයෙන් වූවක් මෙන් රාවය පිළිබඳ මා තුළ වූ ප්‍රතිරූපය බිඳ වැටිණි. මා අදටත් රාවය පුවත්පත කියවන නමුදු ඒ කළකට පෙර පැවැති ආලෝලනයෙන් සහ විශ්වාසී බවින් යුතුව නම් නොවේ.

වත්මන් රාවය තම පුවත්පතෙහි දෙවැනි පිටුවෙහි "ශේෂ පත්‍රය" යන නමින් ලිපියක් සතිපතා පළකරයි. එහි පළවන්නේ රටෙහි සමකාලීන සිදුවීම් කිහිපයක් පිළිබඳ අදාළ ලේකඛයාගේ (තරිඳු උඩුවරගෙදර) පශ්චාත් කියවීමයි. එකී සිදුවීම් වල වරද-නිවැරදි බව, සත්‍යය-අසත්‍යය බව අර්ථගැන්වීමයි. ඒ අර්ථයෙන් ගත් කළ මෙම ලිපිය රාවයේ ක්‍රියා කලාපය පිළිබඳ මාගේ පශ්චාත් කියවීමයි, ශේෂ පත්‍රයයි. මෙම ශේෂ පත්‍රය පිළිබඳ රාවයේ ප්‍රතිචාරය කුමක් ද?

'තොරතුරු අයිතියේ ස්වර්ණමය යුගය' යන මැයෙන් නම් වූ තම කතුවැකියේදි රාවය කතුවරයා තොරතුරු දැන ගැනීමේ අයිතිය තොතුරු සංස්කෘතියක් බවට පත් කිරීමේ වගකීමක් අප සැමට ඇති බව අවධාරණය කර ඇත. එම වගකීම පිලිබඳ ස්වකීය බැඳීම ඔහු ක්‍රියාවෙන පෙන්වා සිටීවිද ? අවංකභාවය සහ පාරදෘශ්‍ය බව පිළිබඳ කතා කරන්නන් අත්‍යන්තයෙන්ම අවංක සහ පාරදෘශ්‍යය විය යුතුය. පුංචි හෝ හුදෙකලා යැයි පවසමින් තමන්ගෙ අභිමතය පරිදි තමන්ට අභිමත නොවන දෑ එකිනෙක මඟහරයාම අවංකභාවයට සහ තමන් පෙනී සිටිනාවායැයි පෙන්වන පරමාදර්ශයන්ට විශාල වූ හානි ගෙනදිය හැක. මා වැරදි නම් එය පෙන්වා දීම ද තමන් අතින් වරදක් වී ඇත්නම් නිවැරදි කර ගැනීමද රාවයේ කාර්යයකි.
රාවයේ පෙළඹවීම කෙබඳුවේද ?

මා මෙය පොදු අවකාශය වෙත ගෙන ආවේ සංවාදගත වීමේ සහ සිදුව ඇති වරද නිවැරදි කර ගැන්මේ බලාපොරොත්තුවෙනි. රාවයේ මාධ්‍යවේදී හිතවතුනි, රාවය පාඨක සහෘදයනි ඔබගේ ප්‍රතිචාර දෙස මම බලා හිදිමි.

**මෙම කරුණ සම්බන්ධව මා "රාවය" වෙත යොමු කළ ලිපිය පහත පළකර ඇත.**

☛

සති දෙකකට පමණ පෙර රාවය පුවත්පත (2013 ජූලි මස 28 ' රාවය ' )කියවමින් සිටි මා හට " සොල්දාදුවෝ සහ ඉගිලෙන මාළුවො "" නම් ලිපියක් කියවීමට ලැබිණි. ඉගිලෙන මාළුවෝ චිත්‍රපටය පිළිබඳව මතුව ඇති කතිකාව පදනම් කරගෙන විකුම් ජිතේන්ද්‍ර විසින් පළ කොට තිබූ එම ලිපියෙහි ඔහු 1988 වසරේ,දහහතරවන වියේ පසුවද්දී මුහුණදුන් අත්දැකීමක් පිළිබඳ ලිය වී තිබූ අතර, ගිය වසරේ (2012)සැප්තැම්බර්- ඔක්තෝම්බර් මාසයන්හි පළවූ රාවය කළාප කිහිපයක් නැවත කියවීමට විකුම් ජිතේන්ද්‍රගේ එම සඳහන හේතු පාදක විය.

'Agenda 14', යුරෝපා සිනමා ඇකඩමිය සමඟ එක්ව සංවිධානය කරනු ලබන කෙටි චිත්‍රපට උළලේදී හොඳම සිනමා විචාරකයා වෙනුවෙන් වන තිස්ස අබේසේකර විචාරක සම්මානය රාවය අනුග්‍රහයෙන් පිරිනමන බවටත් ඒ සඳහා අයදුම් කිරීමට කැමැත්ත දක්වන්නන් " සමකාලීන ශ්‍රී ලංකාවේ ප්‍රකාශන මාධ්‍යයක් ලෙස ඩිජිටල් සිනමා භාවිතය " යන මාතෘකාව යටතේ තම විචාරය රචනා කළයුතු බවටත් සඳහන් දැනුම් දීමක් පෙරකී මාසවල රාවය පුවත්පතෙහි අවස්ථා කිහිපයකදී පළ වී ඇත. 2012 ඔක්තෝම්බර් මස 25 දිනට පෙර අයදුම් කල යුතු බවට වූ මෙම සටහනෙහි අදාළ විචාර සම්මානයට අයදුම් කරන්නන් වයස අවරුදු 35 ට අඩු සිනමා විචාරකයන් විය යුතු බව තද කළු අකුරින් සඳහන් වේ. 2012 දෙසැම්බර් මස 09 වන දින අසංකා අබේසේකර මහත්මිය අතින් සම්මාන ප්‍රදානය කෙරෙනු මෙම සිනමා විචාරක තරඟයේ පළමු ස්ථානය දිනාගෙන ජයග්‍රාහකයා වූයේ විකුම් ජිතේන්ද්‍රය. (" අංකිතකරණය අබිමුව දැක්මෙහි සාරය : ගොඩනැගිම සහ මුදා හැරීම " නම් පළමු ස්ථානය හිමිකරගත් එම ලිපිය 2012 දෙසැම්බර් 16 සහ 25 දින රාවය පුවත්පතෙහි ද, 14 ප්‍රකාශනයට අවකාශයක් සිනමා සඟරාවේ 2012 ජූලි - දෙසැම්බර් ද්විත්ව කලාපයේ ද පළ විය)

1988 දී වසය අවුː 14 ක් වූ විකුම් ජිතේන්ද්‍ර 2012 වසර අග පවත්වන්නට යෙදුනු වසය අවුː 35 ට අඩු සිනමා විචාරකයන් සඳහා වන තරඟයක ජයග්‍රාහකයා වූයේ කෙසේ ද? " 1988 අවුරුද්ද අග්ගිස්ස ....... දවස හරියටම මතක නෑ.... ඒත් සිද්ධිය මතකයි. ඒ වයස අවුරුදු දහහතරක් වුන ළමයෙක් විදියට තමන්ගේ මරණයේ භීතිය තුවක්කුවක්

ළඟ දැණුනු මොහොතක් විදිහට...... අපි ඒ දවස්වල ඉස්කෝලේ නවය වසරේ සිටියෙ. කොට කලිසම් අඳින කොළු කුරුට්ටෝ ” මෙලෙස තම අත්දැකීම පිළිබඳව විස්තර කරන විකුම් ජිතේන්ද්‍ර ඒ අනුව 1974 වසරේ උපන් අයකු විය යුතුයැයි අනුමාන කළ මම එය නිශ්චිත කර ගැනීමට ඔහුගේ දුරකථන අංකය සොයාගෙන එයට ඇමතුමක් ගත්තෙමි. මාගේ අනුමානය නිවැරැදි කරමින් ඔහු 1974 දී උපන් අයෙකු බව මා හා පැවසීය.

තිස්ස අබේසේකර විචාරක සම්මානය සඳහා අයදුම් කරන්නන් වයස අවු: 35 ට අඩුවිය යුතු බව පැහැදිලිව දක්වා තිබූ බවත්, 1974 දී උපත ලද්දේ නම් සම්මානය සඳහා අයදුම් කරන විට වයස අවුරුදු 38 ද සම්පූර්ණ කර සිටීමට බොහෝ විට හැකියාව තිබූ ඔහු සම්මානයට අයදුම් කර ජයග්‍රහණය කළේ කෙසේදැයි විමසා සිටි විට විකුම් ජිතේන්ද්‍රගේ පිළිතුර වූයේ එවැනි 35 ක සීමාවක් පිළිබඳව තමන් නොදැන සිටිබවයි.
මීට පෙර අවස්ථා කිහිපයකදීම විකුම් ජිතේන්ද්‍ර විසින් රාවයට ලියූ ලිපි කියවා තිබූ මා හට ඔහුගේ එම ප්‍රකාශය මහත් විමතියක් ගෙන දුන්නේ වසර කිහිපයක සිට රාවයටලියන ඔහු වැන්නෙකු නිත්‍ය රාවය පාඨකයෙකද විය හැකි නිසා මාස තුනක් පුරාවට රාවයේ පළවූ සටහනක් නොදැක සිටියේ කෙසේද? එහි සඳහන්ව තිබූ අවුරුදු 35සීමාව නොදැක සිටියේ කෙසේද ? යන පැහැදිලි ප්‍රශ්නනිසාවෙනි.

'Agenda 14' හි කාර්යභාරය අවතක්සේරු කිරීම හෝ විකුම් ජිතේන්ද්‍ර අපහසුතාවයට ළක් කිරීම මාගේ මෙම ලිපියේ අරමුණ නොවේ. නමුත්, තිස්ස අබේසේකර වැනි අද්විතීයෙකු නමින් සහ රාවය වන් පුවත්පතක අනුග්‍රහයෙන් කෙරුන සම්මාන පිරිනැමීමක නිවැරදි නොවන යම් ක්‍රියාවලියක් සිදු වී ඇති ව පෙනී යයි. එම නිසා Agenda 14 සහ රාවය වෙතින් පහත සඳහන් කරුණු වලට පිළිතුර අපේක්ෂා කරමි.

- තිස්ස අබේසේකර විචාරක සම්මානය සඳහා වන අයදුම්කරුවන්ගේ රචනා සමීක්ෂණය කළ සමීක්ෂණ මණ්ඩලය කවුරුන්ද? (එම සමීක්ෂණ මණ්ඩලය Agenda 14 සංවිධානය අන්තර්ගත පුද්ගලයින්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් ද, එසේ නොමැති නම් ඊට පරිබාහිර පුද්ගලයන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් ද යනවග)

- ❖ රාවය පුවත්පතෙහි පළකල දැන්වීමෙහි සඳහන් වන වයස අවුරුදු 35 ට අඩු යනවෙන් වූ සීමා පැනවීම පසුව වෙනස් කිරීමකට ලක් කළේද? එසේ වෙනස් කලේ නම් ඊට හේතු වූ කාරණා මොනවා ද? එමෙන්ම එවැනි වෙනස් කිරීමක් තරඟයට අයදුම් කිරීමට අපේක්ෂාවෙන් සිටින්නන් හට දැක ගත හැකි පරිදි මුල් දැන්වීම හා සමාන ලෙස ප්‍රසිද්ධ කොට පළ කළේද?
- ❖ Agenda 14 මගින් ප්‍රකාශයට පත් කරනු ලබන 14 ප්‍රකාශනයට අවකාශයක් සඟරාවේ සැලසුම් කරුවකු ලෙස නම සඳහන් වන වික්‍රම් ජිතේන්ද්‍රගේ අයදුම්පත සළකා බැලීමේ දී Agenda 14 ලැදියාවන් අතර ගැටුමකට (Conflict of Interest ) මුහුණ නොපෑවේ ද?

මම රාවය කියවන දහසකුත් පාඨකයන් මෙන් තවත් එක් සාමාන්‍යය පාඨකයෙක් මිස මෙම විචාරක සම්මානයට අයදුම් කළ අයෙකු නොවමි. එමෙන්ම, වික්‍රම් ජිතේන්ද්‍ර සහ Agenda 14 හි මතවාද හා ක්‍රියාකාරකම් රාවය සහ වෙනත් මාධ්‍ය මගින් කියවා, අසා - දැක ඇතිවා මිස මම ඔවුන් කිසිවෙකුත් පෞද්ගලිකව නොහඳුනන්නෙක් වෙමි. එම නිසා මේ හා බැඳුනු පුද්ගලික අභිලාෂයක් හෝ යටි අරමුණක් හෝ යටි අ් මා හට නොමැත. නමුත්, තිස්ස අබේසේකර විචාරක සම්මාන දිනාගනු අටියෙන් එම තරගයට විචාර යොමු කළ සුදුසුකම් සැපුරූ අයදුම්කරුවන් සහ සම්මානය සඳහා අයදුම් කරනු රිසි වුවද වයස අවුරුදු 35 යන සීමාව දැක ඉල්ලුම් නොකළ අන්අය වෙනුවන්ද Agenda 14 සහ රාවය වෙතින් සාධරණ පිළිතුරක් අපේක්ෂා කරමි.

**ඉසුරු රංගනාත් කරුණාතිලක**